# බදුල්ල නාරංගල කඳුවැටිය හා සබැඳි ඓතිහාසික ජනප්‍රවාද හා ලිඛිත සාධක පිළිබඳව අධ්‍යයනයක්

ඒ. අනෝමදස්සි හිමි[1], බී. ඥානසිරි හිමි[2], කේ. කුසලානන්ද හිමි[3]

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නාරංගල අඩි 4540කින් යුක්ත කඳු වැටියකි. මේ සඳහා නාරංගල නාමය යෙදී ඇත්තේ නාරං ගෙඩියක හැඩය නිසා බවට විශ්වාසයක් පවතී. ජනප්‍රවාදාත්මකව නාරංගල පිළිබඳව අධ්‍යයන කරන විට එහි ඉතිහාසය බුද්ධ කාලය දක්වාම ඇතට යයි. බුදුන් වහන්සේ පළමු වැනි වරට දුරුතු පොහෝ දින මහියංගණයට වැඩි අවස්ථාවේදී බුදුරදුන් සිය සිරිපතුළ මෙම කඳුවැටියේ සටහන් කිරීමට අදහස් කර තිබූ බවත් එහෙත් එම පොහෝ දිනයේ නාරංගල ආසන්නයේ ගම්මානයක ගොවීන් පිරිසක් සී සාමින් සිටි නිසාවෙන් බුදුරදුන් මෙම අදහස අත්හැරගත් බව ඌව ජනප්‍රවාදයන්හි සඳහන් වේ. ඒ අනුව නාරංගල හා තදාශ්‍රිත ඉතිහාසය වසර 2600 දක්වා ඇතට විහිද යන්නකි. වළගම්බා රාජ සමයේ ද නාරංගල සම්බන්ධයෙන් ඇති ජනශ්‍රැතියක වලගම්බා රාජ්‍ය කාලයේ ඇති වූ යුධ වාතාවරණය තුළ වළගම්බා රජු ඇතුළු පිරිසක් නාරංගල ආසන්නයේ පිහිටා ඇති බෝගොඩ විහාරය ආශ්‍රිතව ආරක්ෂාවට කලක් සැඟව සිට ඇත. මෙම විහාරයේ සිට දෝව රජමහා විහාරය දක්වා උමං මාර්ගයක් මේ කාලයේ ඉදිකර ඇති අතර ඉන් එක් මාර්ගයක් නාරංගල කන්දට වැටී ඇති බවත් සඳහන් වේ. මෙම විහාරස්ථාන ද්වයේම මෙම උමං පිවිසුම් දොරටු අදටත් දක්නට තිබේ. නාරංගල තෙක් ඇති මෙම උමං මාර්ගය පිළිබඳව දැක්වෙන තවත් ජනප්‍රවාදයක් නම් කලකට පෙර එක් භික්ෂුවක් සුනඛයෙකු හා මෙම උමං මාර්ගයේ කෙළවර සොයා යනු පිණිස උමගට පිවිස ඇත. ඉක්බිති ඒ භික්ෂුව සමඟ ගිය සුනඛයා නාරංගල කන්දෙන් මතුව ඇති බවත් භික්ෂූන් වහන්සේ නොපැමිණි බවත් තත් ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙම උමං මඟ රාවණා සමයේ සිට පවතින්නක් බව ඌවේ ඇතැම් ජනප්‍රවාදයක සඳහන් වේ. බ්‍රිතාන්‍ය පාලන කාලයේ එක් වාර්තාවක නාරංගල කඳුවැටිය ආසන්නයේ පිහිටා ඇති ලෙන් සමූහය 1817-18 නිදහස උදෙසා කළ අරගලයේ පුහුණුවීම්, රැස්කිරීම් හා ආරක්ෂක කටයුතු සඳහා මහත් සේ උපකාර වී ඇති බව දක්වා තිබේ. එසේම 1818 ජනවාරි මාසයේ 'කැප්ටන් බ්ලාන් කෙන්බර්ග්' නාරංගල කඳු මායිම හරහා තම හමුදාව මහනුවර සිට වෙල්ලස්ස කරා ගෙනගිය බව බ්‍රිතාන්‍ය ලේඛනවල කැරැල්ල පිළිබඳ සටහනක දැක්වේ. නිදහස් අරගලයට උරදුන් දේශීය ප්‍රාදේශීය නායකයෝ කිහිපදෙනෙක්ම බ්‍රිතාන්‍යයන් විසින් ඔවුන්ට ලැබුණු තොරතුරු අනුව ඔවුන් අල්ලා ගන්නා ලද්දේ මෙම නාරංගල කඳු මායිම ආසන්නයේදීය. නිදහස් අරගලයට දායකත්වය දුන් කිවිලේගෙදර මොහොට්ටාල වැනි විරු චරිත කිහිපදෙනෙක්ගේම ජන්මය නාරංගල ගම්මානයේ සිදුව ඇත. මෙසේ සියවස් ගණනක අතීතයක් ඇති නාරංගල හා තදාශ්‍රිතව අදටත් බෝගොඩ විහාරය ඇතුළු පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන රැසක්ම දැකගත හැකිය.

ප්‍රමුඛ පද : ජනප්‍රවාද, නාරංගල, පුරාවිද්‍යාත්මක, බෝගොඩ විහාරය, ලේඛන

---

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anomadassi156@gmail.com

[2 3] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.bamunugamahamuduruwo@gmail.com